රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව
அரசாங்க தகவல் திணைக்களம்
Department of Government Information

**2023-11-20 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල**
**රැස්වීමේදී එළඹුණු තීරණ**

**01. රාජ්‍ය සේවයේ ආරවුල් වැළැක්වීම සහ ආරවුල් නිරාකරණය සඳහා යාන්ත්‍රණයක් හඳුන්වා දීම**

පෞද්ගලික අංශයට සමාන යාන්ත්‍රණයක් රාජ්‍ය සේවයේ ආරවුල් නිරාකරණය කිරීම සඳහා හඳුන්වා දීමේ අරමුණින් සමාජ කතිකාවත, උපදේශනය, සමථකරණය සහ බේරුම්කරණය යන සංකල්ප මත පදනම්ව, ආරවුල් වැළැක්වීම සහ ආරවුල් නිරාකරණය සඳහා යාන්ත්‍රණයක් පිළිබඳ නියමු ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම පිණිස 2020-11-16 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, සෞඛ්‍ය සහ ප්‍රවාහන ක්ෂේත්‍රයේ සේවා ස්ථාන 04ක අදාළ නියමු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර ඇති අතර, ඒ සඳහා ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ තාක්ෂණික මූල්‍ය සහාය ලැබී තිබේ. එම නියමු ව්‍යාපෘතිය යටතේ නියමු සේවා ස්ථාන සංසද පිහිටුවා ඇති අතර, ඒවායේ ක්‍රියාකාරිත්වය හේතුවෙන් අදාළ පාර්ශ්වයන් අතර සහයෝගිතාව වර්ධනය වී ආරවුල් වැළැක්වීම සහ ආරවුල් නිරාකරණය සඳහා පදනමක් නිර්මාණය වන බව තහවුරු වී ඇත. එකී නියමු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම මඟින් අත්කර ගනු ලැබ ඇති සාර්ථකත්වය මත පදනම්ව, පහත සඳහන් පරිදි කටයුතු කිරීම පිණිස රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍ය වශයෙන් ගරු අග්‍රාමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී:

* රජයේ ආයතනවල සේවා ස්ථාන සංසද ස්ථාපිත කිරීම.
* සෞඛ්‍ය, ප්‍රවාහන, වරාය හා නාවික, විදුලිබල හා බලශක්ති, අධ්‍යාපන සහ අනෙකුත් අංශ සඳහා වෘත්තීය සංගම්වල හා කළමනාකාරිත්ව නියෝජිතයින්ගෙන් සමන්විත ආංශික සංසද පිහිටුවීම.
* වෘත්තීය සංගම්, අදාළ අමාත්‍යාංශ/ආංශික සභා, ආයතන අධ්‍යක්ෂ ජනරාල්, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ සහ ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ නියෝජිතයින්ගෙන් සමන්විත ජාතික රාජ්‍ය සංවාද සංසදය පිහිටුවීම.



163, කිරුළපන මාවත, කොළඹ 05, ශ්‍රී ලංකාව.
163, கிருலபனை வைனியூ, கொழும்பு 05, இலங்கை.
163, Kirulapona Avenue, Colombo 05, Sri Lanka.
දු தொ T - (+94 11) 2515759
ෆැ பெ F - (+94 11) 2514753
ඊ மி E - dg@dgi.gov.lk
www.dgi.gov.lk
www.news.lk

* පළාත් මට්ටමින් පළාත් සමථකරණ මණ්ඩල 09ක් ස්ථාපිත කිරීම.

* රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය යටතේ ජාතික බේරුම්කරණ සංචිතයක් ස්ථාපිත කිරීම.

## 02. ශ්‍රී ලංකාවේ රජරට විශ්වවිද්‍යාලය සහ ඇමෙරිකා එක්සත් ජනපදයේ මිචිගන් ප්‍රාන්ත විශ්වවිද්‍යාලය අතර හවුල් ගිවිසුමකට එළඹීම

ධාරිතා සංවර්ධනය කිරීම, පර්යේෂණ සහයෝගීතා ගොඩනගා ගැනීම හා සුහුරු කෘෂිකර්මාන්තයට අදාළ නවෝත්පාදන සහ බිම් මට්ටමේ යෙදවුම් සංවර්ධනය කිරීමේ අරමුණින් ශ්‍රී ලංකාවේ රජරට විශ්වවිද්‍යාලය සහ ඇමෙරිකා එක්සත් ජනපදයේ මිචිගන් ප්‍රාන්ත විශ්වවිද්‍යාලය අතර හවුල් ගිවිසුමකට එළඹීම සඳහා දෙපාර්ශ්වය අතර එකඟතාවකට පැමිණ ඇත. ඒ සඳහා වන යෝජිත කෙටුම්පත් ගිවිසුමට විදේශ කටයුතු අමාත්‍යාංශයේ එකඟතාව සහ නීතිපතිගේ නිෂ්කාශනය ලැබී තිබේ. ඒ අනුව, යෝජිත ගිවිසුමට අත්සන් තැබීම පිණිස අධ්‍යාපන අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 03. ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය සහ ඉන්දියානු පුවත්පත් මණ්ඩලය අතර සහයෝගීතාව පිළිබඳ අවබෝධතා ගිවිසුම

විෂයානුබද්ධ වැඩමුළු හා සම්මන්ත්‍රණ පැවැත්වීම මඟින් ජනමාධ්‍යවේදීන්ගේ දැනුම හා කුසලතා වර්ධනය කිරීම, දෙපාර්ශ්වය අතර සම්පත් හුවමාරු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, ජනමාධ්‍ය ආචාරධර්ම වර්ධනය කිරීමට අදාළ ක්‍රියාකාරකම් සහ ජනමාධ්‍ය නිදහස හා සාමකාමී ජනමාධ්‍ය භාවිතයක් ප්‍රචලිත කිරීම වැනි ක්ෂේත්‍රයන්ට අදාළව දෙපාර්ශ්වය අතර සහයෝගීතාව පිණිස ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය සහ ඉන්දියානු පුවත්පත් මණ්ඩලය අතර වසර 05ක කාලයක් සඳහා 2018-11-16 දින අවබෝධතා ගිවිසුමක් අත්සන් තබා ඇත. එකී ගිවිසුමේ කාලසීමාව මේ වන විට ඉකුත් වී ඇති බැවින් තවත් වසර 05ක කාලයක් සඳහා නව අවබෝධතා ගිවිසුමකට අත්සන් තැබීමට යෝජනා වී ඇත. ඒ සඳහා වන යෝජිත කෙටුම්පත් ගිවිසුමට විදේශ කටයුතු අමාත්‍යාංශයේ එකඟතාව ලැබී තිබේ. ඒ අනුව, යෝජිත අවබෝධතා ගිවිසුමට අත්සන් තැබීම පිණිස ජනමාධ්‍ය අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

04. **මාස හයේ සිට අවුරුදු තුන දක්වා ළමුන් සඳහා ත්‍රිපෝෂ ඇතුළු ආහාර අතිරේක වැඩසටහන් සඳහා වන ඇෆ්ලාටොක්සින් කඩඉම් මට්ටම් සංශෝධනය කිරීම**

සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරනු ලබන මාතෘ හා ළමා සෞඛ්‍ය වැඩසටහන යටතේ මාස 06 සිට අවුරුදු 05 දක්වා අඩු පෝෂණ තත්ත්වයක් ඇති දරුවන් සඳහා අතිරේක ආහාරයක් වශයෙන් ද ගර්භණී සහ කිරි දෙන මව්වරුන්ට අතිරේක පෝෂ්‍ය පදාර්ථයක් වශයෙන් ද 'ත්‍රිපෝෂ' ලබා දීම සිදු කරයි. එහෙත්, 1980 අංක 26 දරන ආහාර පනත යටතේ පවතින රෙගුලාසිවල නියම කර ඇති සම්පූර්ණ ඇෆ්ලාටොක්සින් සඳහා වන දැඩි කඩඉම් මට්ටම් හේතුවෙන් ත්‍රිපෝෂ නිෂ්පාදනය සඳහා අවශ්‍ය බඩඉරිඟු ලබා ගැනීම දුෂ්කර වී ඇත. එබැවින්, ජාත්‍යන්තරව පිළිගත් අතිරේක ආහාරවල පවතින ඇෆ්ලාටොක්සින් මට්ටම වන B1 වර්ගය සඳහා 5 ppb මට්ටම සහ සමස්ත ඇෆ්ලාටොක්සින් මට්ටම 10ppb යන කඩඉම් මට්ටම් අදාළ කර ගැනීම පිණිස සෞඛ්‍ය අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

05. **නුවරඑළිය එලිසබෙත් රැජින මාවතේ පිහිටි "පැරණි සී බෑන්ක් රෙස්ට් (Cey-Bank Rest) ගොඩනැගිල්ල හා ඉඩම" සංවර්ධනය කර පවත්වාගෙන යාම**

නාගරික සංවර්ධන අධිකාරියට අයත් නුවරඑළිය එලිසබෙත් රැජින මාවතේ පිහිටි පැරණි සී බෑන්ක් රෙස්ට් (Cey-Bank Rest) ගොඩනැගිල්ල හා ඉඩම නැවත සංවර්ධනය කර පවත්වාගෙන යාම සඳහා පෞද්ගලික අංශයේ ආයෝජකයින්ගෙන් තරගකාරී ආයෝජන යෝජනා කැඳවා ඇත. ඉදිරිපත් වූ යෝජනා ඇගයීමෙන් අනතුරුව, අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර සාකච්ඡා සම්මුති කමිටුව විසින් ඉදිරිපත් කරනු ලැබ ඇති නිර්දේශය මත පදනම්ව අදාළ දේපළ වසර 50ක බදු කාලසීමාවක් සඳහා කොලොනියල් ප්‍රොපටීස් ප්‍රයිවට් ලිමිටඩ් වෙත ලබා දීම පිණිස නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

06. **ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් සේවයේ නියුක්ත කරවීම පිළිබඳ ශ්‍රී ලංකා ජනරජය සහ ඊශ්‍රායල් රජය අතර ගිවිසුම ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම**

ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් ඊශ්‍රායල් රාජ්‍යයේ නිශ්චිත ශ්‍රම වෙළෙඳපොළ අංශවල තාවකාලිකව සේවයේ නියුක්ත කරවීම සඳහා ඊශ්‍රායල් රජය සමඟ ගිවිසුමකට එළඹීමටත්, ඒ සඳහා දෙපාර්ශ්වය අතර මූල ලේඛයකට අත්සන් තැබීමටත් 2020-02-05 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී

අනුමැතිය ලබා දී ඇත. එම ගිවිසුමට අදාළව, ඊශ්‍රායලයේ කෘෂිකාර්මික කටයුතු සඳහා ශ්‍රමිකයින් බඳවා ගැනීමට එරට ජනගහන, සංක්‍රමණ සහ දේශ සීමා අධිකාරිය අපේක්ෂා කරනු ලබයි. ඒ අනුව, අදාළ ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම සඳහා 2023-11-06 දින දෙපාර්ශ්වය අතර අත්සන් කරන ලද බව සඳහන් කරමින් කම්කරු හා විදේශ රැකියා අමාත්‍යතුමා ඉදිරිපත් කළ තොරතුරු අමාත්‍ය මණ්ඩලය විසින් සැලකිල්ලට ගන්නා ලදී.

## 07. විද්‍යුත් මාධ්‍ය සඳහා විකාශන නියාමන කොමිෂන් සභා පනත හඳුන්වා දීම

භාෂණයේ සහ ප්‍රකාශනයේ නිදහස උපරිමයෙන් සුරක්ෂිත කරමින් ප්‍රශස්ත මාධ්‍යකරණයක් තහවුරු කිරීම අරමුණු කර ගනිමින් විද්‍යුත් මාධ්‍ය සඳහා විකාශන නියාමන කොමිෂන් සභා පනතක් හඳුන්වා දීම පිණිස පනත් කෙටුම්පතක් සකස් කිරීම සඳහා ජනමාධ්‍ය අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව 2022-09-22 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී සාකච්ඡාවට ගන්නා ලදී. එහිදී, යෝජිත පනත් කෙටුම්පත සකස් කිරීමේ දී අවධානය යොමු කළ යුතු ප්‍රතිපත්තිමය කරුණු කවරේ ද යන්න පිළිබඳව නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ ඇමතිතුමාගේ ප්‍රධානත්වයෙන් අමාත්‍ය මණ්ඩල අනුකමිටුවක් පත් කරන ලද අතර, එකී කමිටුව විසින් යෝජිත විකාශන නියාමන කොමිෂන් සභා පනත් කෙටුම්පත සකස් කිරීම පිණිස පදනම් කර ගැනීම සඳහා සුදුසු විධිවිධාන සහිතව මූලික කෙටුම්පතක් පිළියෙල කර තිබේ. එකී මූලික කෙටුම්පත මත පදනම්ව පනත් කෙටුම්පතක් සකස් කරන ලෙස නීති කෙටුම්පත් සම්පාදකට උපදෙස් දීම පිණිස ජනමාධ්‍ය අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 08. ශ්‍රී ලංකා විදුලිබල පනත් කෙටුම්පත

විදුලිබල ක්ෂේත්‍රය සඳහා ආයතනික ප්‍රතිසංස්කරණ හඳුන්වා දෙමින් වර්තමාන ආර්ථික, සමාජීය හා පාලන අවශ්‍යතාවන්ට ගැළපෙන අයුරින් නව විදුලිබල පනතක් හඳුන්වා දීම පිණිස අමාත්‍ය මණ්ඩලය විසින් මීට පෙර අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, නීති කෙටුම්පත් සම්පාදක විසින් සකස් කරනු ලැබ ඇති පනත් කෙටුම්පත සඳහා නීතිපතිගේ නිෂ්කාශනය ලැබී තිබේ. එකී පනත් කෙටුම්පත රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීමටත්, ඉන් අනතුරුව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමටත් විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**09. යෝජිත ශ්‍රී ලංකා - තායිලන්ත නිදහස් වෙළෙඳ ගිවිසුම (SLTFTA) පිළිබඳ සාකච්ඡා**

යෝජිත ශ්‍රී ලංකා - තායිලන්ත නිදහස් වෙළෙඳ ගිවිසුම පිළිබඳව පවත්වනු ලබන සාකච්ඡා 2023 දෙසැම්බර් මාසය වන විට අවසන් කර අදාළ ගිවිසුම 2024-02-03 දින අත්සන් තැබීමට අපේක්ෂා කරනු ලබයි. එකී සාකච්ඡාවන්හි 06 වන සහ 07 වන වටයන්හිදී එළඹෙන ලද එකඟතා අනුව, සංයෝජිත වර්ගීකරණ සංකේතාංක 2022 මත පදනම්ව වසර 15ක කාලයක් තුළ සංයෝජිත වර්ගීකරණ සංකේතාංකයන්ගෙන් 80%ක් ලිහිල් කිරීමටත්, වසර 15-18ක කාලය තුළ සංයෝජිත වර්ගීකරණ සංකේතාංකයන්ගෙන් 5%ක් අර්ධ වශයෙන් ලිහිල් කිරීමටත්, සංයෝජිත වර්ගීකරණ සංකේතාංකයන්ගෙන් ඉතිරි 15% සෘණ ලැයිස්තුවට ඇතුළත් කිරීමටත් හැකි වන පරිදි සකස් කරනු ලැබ ඇති ශ්‍රී ලංකාවේ තීරු බදු ලිහිල්කරණ වැඩසටහන ගරු ජනාධිපතිතුමා විසින් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදුව, ඒ සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා දීමට තීරණය කරන ලදී.

**10. ආයෝජන මණ්ඩලයේ නොවන දැනට පවත්නා සමාගම්/1978 අංක 4 දරන ආයෝජන මණ්ඩල පනතේ 16 වන වගන්තිය යටතේ අනුමත සමාගම් සඳහා 1978 අංක 4 දරන ආයෝජන මණ්ඩල පනතේ 17 වන වගන්තිය යටතේ අනුමැතිය ලබා දීම**

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතට නොගැනෙන දැනට පවත්නාගෙන යනු ලබන ව්‍යාපාරයන් එකී මණ්ඩලය යටතට පත් කිරීමෙන් අනතුරුව එවැනි ව්‍යාපාරයන්හි ආයෝජනය කිරීම පිණිස ආයෝජකයන්ගේ නැඹුරුවක් පවතින බව පෙනී ගොස් ඇත. විශේෂයෙන්ම සිය ව්‍යාපාරයන්ට ලැබෙන පිළිගැනීම හා ආරක්ෂාව හේතු කොට ගෙන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමඟ ගිවිසුම්ගත වීමට විදේශ ආයෝජකයින් විසින් උනන්දුවක් දක්වනු ලබයි. ඒ අනුව ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට කටයුතු කිරීමට හැකි වන පරිදි විධිවිධාන හඳුන්වා දෙමින් ආයෝජන මණ්ඩල පනතේ 24 වන වගන්තිය යටතේ ආයෝජන ප්‍රවර්ධන විෂයභාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2023-06-01 දිනැති අති විශෙෂ ගැසට් නිවේදනය මඟින් නියෝගයක් පනවනු ලැබ ඇත. එකී නියෝගය අනුමැතිය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම පිණිස ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**********